# පාරිභෝගික මාර්ගෝපදේශය - ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන්

ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයෙකු, ඕස්ට්‍රේලියානු නීති වෘත්තිකයෙකු හෝ බැහැර කල අයෙකු නොවන කිසිම අයෙකු විසින් ඕස්ට්‍රේලියාව තුල සංක්‍රමණ සහාය ලබාදීම නීති විරෝධීවේ. යම් කිසි අයෙකු විසින් ඕස්ට්‍රේලියාව තුල නීති විරෝධී ආකාරයට සංක්‍රමණ සහාය ලබා දෙන්නේ නම්, Department of Home Affairs වෙබ් අඩවියේ ඇති Border Watch Online Report උපයෝගී කරගෙන ඒ බව වාර්තා කල යුතුය. ඔබගේ සංක්‍රමණ කරුණ සම්බන්ධයෙන් සහාය ලබාදෙන කිසිවෙකු විසින් ඔබ හට වීසා බලපත්‍රයක් ලබා දෙන බවට තහවුරුවක් ලබා දීමට නොහැකි බව දැන ගැනීම ඉතා වැදගත්වේ.

---

## ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් (Registered Migration Agents)

ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් විසින් වෘත්තීය සම්මතයන්ට අනුව කටයුතු කිරීම, හැසිරීම් සංග්‍රහයක් පිළිපැදීම සහ සංක්‍රමණ නීති සහ ක්‍රියාපටිපාටීන් සම්බන්ධ දැනුම යාවත්කාලීනව පවත්වා ගැනීම, සිදුකල යුතුය.

සියළු ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් හට අනන්‍ය Migration Agents Registration Number (MARN) අංකයක් ඇත. යම් අයෙකු හට ලියාපදිංචිය ඇතිද යන්න සොයා බැලීම සඳහා OMARA වෙබ් අඩවිය වන www.mara.gov.au වෙත පිවිසෙන්න.

**The Office of the Migration Agents Registration Authority (OMARA)** යන්න Department of Home Affairs හි කොටසක් වන අතර ඕස්ට්‍රේලියාවේ ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන්ගේ නියාමන ආයතනයවේ. OMARA මගින් පහත දේ සිදුවේ:

- ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් ඕස්ට්‍රේලියාවේ ලියාපදිංචිය සඳහා කරනු ලබන අයදුම්පත් ඇගයීම සහ තීරණය කිරීම;
- ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන්ගේ හැසිරීම නියාමනය කරන අතර පැමිණිලි විමර්ශනය කර, අවශ්‍ය නම්, විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීම.

OMARA හට ඔබගේ වීසා හෝ අනුග්‍රාහක අයදුම්පත්‍ර හෝ ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයකු හට ඔබගේ ගාස්තු නැවත ලබා දෙන ලෙස නියම කිරීම සම්බන්ධයෙන් උපකාර කල නොහැක.

## හැසිරීම් සංග්‍රහය

ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් සඳහාවූ හැසිරීම් සංග්‍රහය මගින් ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් විසින් පහත ආකාරයට කටයුතු කල යුතු බවට පනවයි:

- ඔබට වීසා බලපත්‍රයක් ලැබීමට ඇති අවස්ථාව සම්බන්ධයෙන් අවංක වීම
- ඔබගේ අයදුම් පත්‍රයේ ප්‍රගතිය සම්බන්ධයෙන් සහ එයට බලපා හැකි කිසියම් කරුණක් සම්බන්ධයෙන් නිවැරදි උපදෙස් ලබාදීම සහ ඔබව දැනුවත් කිරීම
- නීතියේ රාමුව තුල සහ ඔබගේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම සහ ඔබගේ පුද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීම
- ඔබගේ අයිතිවාසිකම් සමඟ ගැටෙන තත්වයක් ඇතිනම් ඒ බව ඔබට දැනුම් දීම සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම
- ලබා දීමට බලාපොරොත්තුවන සේවය ආරම්භ කිරීමට පෙර ඔබට ලිඛිත ප්‍රකාශනයක්, ගාස්තු සහ වෙනත් වියදම් සම්බන්ධ ඇස්තමේන්තුවක් ලබා දීම
- ඔබ කලින් ගාස්තු ගෙවයි නම්, එම මුදල වෙනමම බැංකු ගිණුමක තබා ගැනීම
- සම්පූර්ණ කල සේවා නම්කර, ගෙවිය යුතු ගාස්තුව සඳහන් කර ඉන්වොයිසියක් ලබා දීම
- ඔබගේ අයදුම් පත්‍රය සැකසීම සම්බන්ධ නිසි වාර්තා තබා ගැනීම.

සම්පූර්ණ Code of Conduct, OMARA වෙබ් අඩවියෙහි ඇත.

## ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් සම්බන්ධ ගැටළු

ඔබගේ ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයා සමඟ ඔබට ගැටළුවක් ඇතිනම්, මුලින්ම එය ඔවුන් සමඟ විසඳා ගැනීමට උත්සාහ ගන්න. ඔබගේ නියෝජිතයා සමඟ එම ගැටළුව විසඳා ගැනීමට නොහැකි නම්, ඔබට උපකාර අවශ්‍ය අවස්ථාවල OMARA සමඟ සම්බන්ධවිය හැකිය. OMARA වෙබ් අඩවියෙහි ඇති complaint form සම්පූර්ණ කිරීම මගින් ඔබගේ ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය.

පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම මගින් ඔබගේ වීසා අයදුම්පත්‍රයට බලපෑමක් සිදුවීම හෝ කලින් වීසා බලපත්‍ර ප්‍රතික්ෂේපවීමක් හෝ අවලංගුවීමක් සම්බන්ධ තීරණයේ කිසිදු වෙනසක් සිදු නොවේ.

## ඕස්ට්‍රේලියානු නීති වෘත්තිකයන් සහ බැහැර කල පුද්ගලයන්

ඕස්ට්‍රේලියානු නීති වෘත්තිකයන් සහ බැහැර කල පුද්ගලයන් ආදී සමහර අය හට ඕස්ට්‍රේලියාව තුල සංක්‍රමණ සහාය ලබාදීම සඳහා ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයකු ලෙස ලියාපදිංචිවීම අවශ්‍ය නැත.

ඕස්ට්‍රේලියානු නීති වෘත්තිකයන් සිය නීති අධිකාරීන්ගේ වෘත්තීය හැසිරීම් රීතීන්ට අනුකූලව ක්‍රියා කල යුතුය. ඔබට නීති වෘත්තිකයෙකු සම්බන්ධයෙන් පැමිණිල්ලක් යොමු කිරීමට අවශ්‍ය නම්, Department

of Home Affairs website හි ඇති ‘Consumer guide – legal practitioners’ කියවන්න.

බැහැර කල අය අතර සමීප මිතුරන් සහ අනුග්‍රාහකයන් ඇත. බැහැර කල අයගේ සම්පූර්ණ ලැයිස්තුවක් *Form 956 – Appointment of a registered migration agent, legal practitioner or exempt person* හි ඇත. බැහැර කල අය විසින් සංක්‍රමණ සහාය ලබාදීම සම්බන්ධයෙන් ගාස්තු අයකල නොහැක.

## පත් කිරීමක් අවසාන කිරීම

පත් කිරීමක් අවසාන කිරීමට ඔබට අවශ්‍ය නම්, *Form 956* සම්පූර්ණ කරන්න.

## පරිවර්තන සහ තෝල්ක සේවාව

පරිවර්තන සහ තෝල්ක සේවාව ඔස්සේ භාෂා පරිවර්තකයෙකු අමතන්න (TIS National) www.tisnational.gov.au ☎ 131 450

2021 ජූලි